# බාල සොහොයුරන්ගේ අධ්‍යාපනය රැකුණා . . .

මා වෛද්‍ය විද්‍යාලයට ඇතුලත්වීම සතුටක් මෙන්ම මට කණගාටුවක්ද ඇති කරවිය. එයට හේතුව මගේ වැඩිමල් සොහොයුරාද විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන අතර මටද උසස් අධ්‍යාපනය තඳහා වියදම් කරන්නට වීමෙන් බාල සොහොයුරන් දෙදෙනාගේ අධ්‍යාපනයට හිහපාඩු ඇතිවේය යන්නයි.

ඉහත ශිෂ්‍යත්වය මටද පිරිනැමෙන බව දැනගන්නට ලැබීමෙන් මම ඉමහත් සතුටට පත්වීමි. ඔබතුමන්ට පින්සිදුවන්නට ශිෂ්‍යත්වලාභී සියල්ලන්ම එසේ සතුටුවනු නොඅනුමානය.

ඔබතුමා දුන් ආදර්ශය සේම උසස් අධ්‍යාපනයෙන් පසු පටු බේදවලින් තොරව වෛද්‍යවරයෙක් ලෙස හැකි උසස්ම අයුරින් සමාජයට සේවය කිරීම මගේ බලාපොරොත්තුවයි.

ඒ. එම්. සී. ජේ. අත්තනායක
දිවුලපිටිය.

# කෝටියක් ලැබෙන්නට . . .



විශ්ව විද්‍යාල සිසුන් තවත් 700 කට ශිෂ්‍යත්ව පිරිනමන්නට දියත් කල මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව දෙවනු ලොතරැයියේ මුල් ටිකට පත එහි නිර්මාතෘ වෙළඳ හා නාවික ඇමති ලලිත් ඇතුලත් මුදලි මහතා අතින් ජනාධිපතිතුමා මිළදී ගනියි.